# කාර්යසාධන වාර්තාව - 02 වන කාර්තුව

# 2017 අප්‍රියෙල් සිට ජූනි දක්වා

**හැඳින්වීම**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, 1996 වර්ෂයේදී, 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවපනත යටතේ ස්ථාපිත කෙරිණ. මානව හිමිකම් කොමිෂන් සභාවේ නෛතිකමය පදනම සහ මෙහෙයුම් මූලධර්මයන් එකී පනතෙහි දක්වා ඇත. මානව හිමිකම් කොමිෂන් සභාව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි යොමුගතව ඇති නමුදු, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විධිමත්ව ස්ථාපිත කරන ලද්දක් නොවේ. කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන යටතේ පත් කෙරේ.

මූලික අයිතිවාසිකම් සහ මානව හිමිකම්වලට අදාලව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි අධිකරණයේ සීමාව පණතින් විග්‍රහ කෙරේ. මූලික අයිතිවාසිකම් වනාහී, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවෙහි IIIඡේදය යටතේ සහතික කර ඇති යම් යම් සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් මෙන්ම ආර්ථික, සාමාජීය සහ සංස්කෘතිකමය අයිතිවාසිකම් වේ. මානව අම්තිවාසිකම් ජාත්‍යන්තර නීතියෙහි විග්‍රහ කර ඇත.

කොමිෂමෙහි ව්‍යවස්ථාපිත කාර්ය භාරයන් වන්නේ :

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි දැක්වෙන විධිවිධානයන්ට අනුගතවීම සහතිකවීම උදෙසා, ක්රියා පරිපාටීන්ට අදාල පැමිණිලි හෝ මූලික අයිතිවාසිකම් කඩකිරීම් හෝ සම්පස්ථව සිදුවිය හැකි කඩකිරීම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම හෝ විමර්ශනය කිරීම.
- මූලික අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂාකිරීම් සඳහා නීති මාලාවන් සහ පරිපාලන නියෝග සහ ක්‍රියා පරිපාටි සම්පාදනය කිරීමෙහි ලා රජයට උපදෙස් දීම හා සහාය වීම
- ජාතික නීතිමාලාවන් සහ පරිපාලන ව්‍යවහාරයන් ජාත්‍යන්තර මානව හිමිකම් නියමයන්ට හා ප්‍රමිතීන්ට අනුගතබවට සහතිකවීම සඳහා රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම
- ජාත්‍යන්තර ගිවිසුම් සහ වෙනත් ජාත්‍යන්තර මානව හිමිකම් සාධන පත්‍රයන්ට අත්සන් තැබීම හෝ එකඟවීම සම්බන්ධයෙන් රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම
- මානවහිමිකම්සම්බන්ධ දැනුම ප්‍රවර්ධනය කිරීම සහ මානව හිමිකම් ආශ්‍රිත අධ්‍යාපනය සලසාදීම ( 1996අංක 21 දරණ පනතේ 10 වන කොටස)

කොමිෂන් සභාව 156 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සහිතව ක්‍රියාත්මක වෙයි. කොමිෂමෙහි කාර්යභාරය ක්‍රියාත්මක කිරීම සඳහා පරීක්ෂණ හා විමර්ශන, අධ්‍යාපන හා විශේෂ වැඩසටහන්, පර්යේෂණ හා මෙහෙයුම්, පරිපාලන හා මුදල් යන අංශවලින් මෙන්ම, ප්‍රාදේශීය කාර්යාල 10 කින් ( අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, යාපනය, කල්මුණේ, මහනුවර, මාතර,ත්‍රිකුණාමළය හා වවුනියාව) සමන්විතය. සෑම අංශයක්ම අධ්‍යක්ෂවරයෙකු යටතේද, සෑම ප්‍රාදේශීය කාර්යාලයක්ම ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරයෙකු යටතේද ක්‍රියාත්මක වේ. එකී අංශ මෙන්ම ප්‍රාදේශීය කාර්යාල, සභාපති සහ/හෝ කොමසාරිස්වරයෙකු/කොමසාරිස්වරු විසින් අධීක්ෂණය කෙරේ.

**කාර්තුව තුළ විශේෂ ක්‍රියාකාරකම්**

i. කොමිෂන් සභාව විසින්, 2017 මැයි මස 30 වන දින, ශ්‍රී ලංකාවේ තුන්වන විශ්ව කාලාන්තර සමාලෝචනය වෙනුවෙන් ස්වකීය වාර්තාව ඉදිරිපත් කරන ලදී.

ii. කොමිෂන් සභාව විසින්, ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය යටතේ ශ්‍රී ලංකාවේ 5 වන කාලාන්තර වාර්තා සමාලෝචනයට අදාළව, ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ස්වකීය වාර්තාව 2017 ජූනි මස 07 වන දින ඉදිරිපත් කරන ලද අතර, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි සභාපතිනිය විසින්, ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳව කමිටුව වෙත දුරකථන සම්මන්ත්‍රණ පහසුකම් ඔස්සේ සහභාගී වී කරුණු ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා වාර්තාව සම්බන්ධයෙන් උද්යෝගීමත් සාකච්ඡාවක් පැවැත්වුණ අතර, සාක්ෂාත් කර ගෙන ඇති ප්‍රගතිය සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත ප්‍රසාදය පිරිනැමිණ.

iii. වධහිංසාවට ලක්වූවන්ට සහාය පළකිරීමේ ජාත්‍යන්තර දිනය-2017 සනිටුහන් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් මාධ්‍ය වැඩසටහනක් පවත්වන ලදී.

iv. කොමිෂන් සභාව විසින්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සඳහා අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය හඳුන්වාදී, ක්‍රියාත්මක කරන ලදී

v. කොමිෂන් සභාව විසින් ප්‍රාදේශීය කාර්යාල අධීක්ෂණය සඳහා නව යාන්ත්‍රණයක් සම්මත කරගන්නා ලදී.

vi. කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ කටයුතු සඳහා නව ප්‍රවාහන ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන ලදී.

vii. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන්සභාවේ කොමසාරිස්වරුන් හා කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන්, කොමිෂන් සභා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී සිංහළ හා දෙමළ අළුත් අවුරුදු උත්සවය පැවැත්වීමට කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලදී.

viii. මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම පිණිස මානව අයිතිවාසිකම්පිළිබඳ කෙටි පණිවුඩ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වෙළඳ සේවය සහ සියළුම ප්‍රාදේශීය සේවාවන් ඔස්සේ සිංහළ සහ දෙමළ මාධ්‍යයෙන් විකාශනය කෙරිණ.

ix. කොමිෂන් සභාව විසින් දිස්ත්‍රික් මට්ටමේ පාසල් සිසුන්ගේ සහභාගීත්වයෙන් යුතු ප්‍රශ්න විචාරාත්මක මානව හිමිකම් තරඟයේ 1 වන අදියර ආරම්භ කෙරිණ.

x. රාජ්‍ය ආයතනවලට විරුද්ධව ගොනු කර ඇති පැමිණිලි විසඳාලීමේ ප්‍රමාදයන් මග හරවා ලීමෙහි ලා මානව හිමිකම් කොමිෂන් සභාව හා සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීමට හැකිවන පරිදි, එකී රාජ්‍ය ආයතනවල සන්ධාන නිලධාරීන් පත් කිරීම පිණිස කොමිෂන් සභාව විසින් 2017.05.30 වන දින රාජ්‍ය ආයතන ප්‍රධානීන් හා සමග රැස්වීමක් පවත්වන ලදී.

xi. කොමිෂන් සභාව විසින්, "දකුණු අප්‍රිකාවේ පශ්චාත් යුද/අර්බුද සමාජයක අත්දැකීම් වලට අදාළව අයිතිවාසිකම් පිළිබඳව්‍යවස්ථාපිත පණත් කෙටුම්පතක් සකස් කිරීම" සම්බන්ධයෙන්, පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම් කාර්යාලය හා එක්ව ප්‍රසිද්ධ දේශනයක් සහ ඉන් අනතුරුව සාකච්ඡාවක් සංවිධානය කරන ලදී. මෙම දේශනය 2017.06.30 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ශ්‍රවනාගාරයේදී පවත්වන ලද්දේ, දකුණු අප්‍රිකානු ජනරජයේ හිටපු නියෝජ්‍ය අග විනිසුරු / දකුණු අප්‍රිකානු ව්‍යවස්ථා අධිකරණයෙහි හිටපු විනිසුරු ඩික්ගැන්ග් මොසෙනෙකේ මහතා විසිනි. මෙම අවස්ථාව ස්වාධීන කොමිෂන් සභා සහ සිවිල් සමාජවල නියෝජිතයින් සහ අනෙකුත් ආරාධිත අමුත්තන්ගේ සහභාගිත්වයෙන් සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ දායකත්වයෙන් වර්ණවත් විය.

xii. සභාපතිතුමිය සහ මාතර ප්‍රාදේශීය කාර්යාලය භාර කොමසාරිස්වරයා 2017 අප්‍රියෙල් මස 25 වන දින මාතර ප්‍රාදේශීය කාර්යාලයෙහි නිල සංචාරයක නියැලී, රාජ්‍ය අංශ සම්බන්ධීකරණ කමිටු සාමාජිකයින් සහ සිවිල් කමිටු සාමාජිකයින් හා සමග රැස්වීමක් පවත්වන ලද අතර, ඉන් අනතුරුව මාධ්‍ය සාකච්ඡාවක්ද පැවැතිවිණ.

ත්‍රිකුණාමළය ප්‍රාදේශීය කාර්යාලය භාර කොමසාරිස්වරයා ත්‍රිකුණාමළය ප්‍රාදේශීය කාර්යාලයෙහි නිල සංචාරයක නියැලී, 2017 ජූනි මස 15-16 දෙදින තුළ රැස්වීම් පවත්වන ලදී.

xiii. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා සීමාවාසික වැඩ සටහනේ තුන්වන පියවර යටතේ ස්වේච්ඡා පදනමින් සහභාගීවීම පිණිස දේශීය හා විදේශීය උපාධි අපේක්ෂකයින්ගෙන් සහ මෑතකදී උපාධිය ලත් උපාධිලාභීන්ගෙන් අයදුම්පත් කැඳවීමට කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී.

xiv. ශ්‍රී ලංකාවේ ආදිවාසින්ගේ අයිතිවාසිකම් සුරැකීමේ කටයුතු මෙහෙයවීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් අවශ්‍ය තොරතුරු ලබාගැනීම කොමිෂන් සභාව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

**රජයට ඉදිරිපත් කරන ලද නිර්දේශ**

- සාලාව වෙඩිබෙහෙත් ගබඩා පිපිරීමෙන් පීඩාවට පත්වූවන්ට වන්දි ගෙවීමට අදාළ කටයුතු සම්බන්ධයෙන් 2017.05.03 වන දින අතුරු නිර්දේශයක් ඉදිරිපත් කරන ලදී.
- 2017.05.31 වන දින අතිගරු ජනාධිපතිතුමන් අමතන ලද ලිපියකින්, දිනෙන් දින වැඩිවන අන්‍ය ආගම් නොඉවසීම සම්බන්ධයෙන් ස්වකීය දැඩි අවධානය කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කෙරිණ.

- 2017.06.17වන දින අතිගරු ජනාධිපතිතුමන් අමතන ලද ලිපියකින්අනුස්මරණය සහ සංහිඳියාව සම්බන්ධයෙන් ස්වකීය මතය ප්‍රකාශ කෙරිණ.

-

## පැමිණිලි සාරාංශය

**ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල– ( 2017.04.01 සිට 2017.06.30දක්වා)**

| පැමිණිලි ස්වාභාවය | ප්‍රාදේශීය කාර්යාලය | | | | | | | | | | | ප්‍රාදේශීය කාර්යාල වල එකතුව | ප්‍රධාන කාර්යාලය | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අම්පාර | අනුරාධපුරය | බදුල්ල | මඩකලපුව | යාපනය | කිලිනොච්චි උප කාර්යාලය | කල්මුණේ | මහනුවර | මාතර | ත්‍රිකුණාමලය | වවුනියාව | | | |
| **පෞද්ගලික නිදහස** | **01** | **41** | **02** | **11** | **21** | **05** | **04** | **22** | **12** | **03** | **29** | 151 | 249 | 400 |
| වධහිංසාව ( ශාරීරික හා මානසික) | - | 19 | - | - | - | - | - | 05 | 02 | 02 | - | 28 | 58 | 86 |
| හිරිහැරකිරීම් | - | 04 | - | 07 | - | - | 01 | 09 | - | - | 05 | 26 | | 26 |
| ලිංගික හිරිහැර | - | - | - | - | - | - | - | - | - | - | 07 | 07 | | 07 |
| තර්ජන | 01 | 01 | 01 | - | 11 | 03 | 02 | - | - | 01 | 11 | 31 | 111 | 142 |
| අවමන් සහගත සැළකීම | - | 02 | - | - | 05 | 01 | 01 | - | - | - | - | 09 | | 09 |
| බලහක්කාරයෙන් අත්අඩංගුවට ගැනීම/රඳවාගැනීම | - | 15 | 01 | 04 | 04 | 01 | | 07 | 09 | | 01 | 42 | 49 | 91 |
| රඳවාගැනීම් තත්ත්වයන් | - | - | - | - | - | - | - | - | - | - | - | - | 01 | 01 |
| අත්අඩංගුවේදී මරණය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| බලහත්කාර/අකැමැත්තෙන් අතුරුදහන්වීම | - | - | | - | - | - | - | - | - | - | - | - | - | - |
| පැහැරගැනීම | - | - | - | - | - | - | - | - | - | - | - | - | 03 | 03 |
| නීතියට පිටින් සිදු කරන ඝාතන | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මරණයට පත්වීම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සිරකරුවන්ගේ අයිතිවාසිකම් | - | - | - | - | - | - | - | - | 01 | | 01 | 02 | | 02 |
| අතුරුදහන්වූ පුද්ගලයින් | - | - | - | - | - | - | - | - | - | - | 02 | *02* | | 02 |
| අතුරුදහන්කිරීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වෙනත් | | | | | 01 | | | 01 | | | 02 | 04 | 27 | 31 |
| **වෙනත් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්** | **-** | - | **-** | 02 | - | - | - | | - | - | - | 02 | 02 | 04 |
| භාෂණ නිදහස | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| රැස්වීමේ නිදහස | - | - | - | - | - | - | - | - | - | - | - | - | 01 | |
| සාංගමික නිදහස | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ආගමික නිදහස | - | - | - | - | - | - | - | - | - | - | - | - | 01 | |
| යාමර්ම් නිදහස | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| තොරතුරු දැනගැනීමේ නිදහස | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| වෙනත් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| **සේවා නියුක්තිය** | 11 | 27 | 14 | 11 | 11 | 01 | 20 | 33 | 23 | 05 | 18 | 174 | 143 | 317 |
| **අධ්‍යාපනය** | **-** | 01 | 10 | 03 | 03 | 03 | 05 | 05 | 10 | 02 | 04 | 46 | 36 | 82 |
| **රාජ්‍ය සුබසාධන සේවා** | 05 | 05 | - | 07 | 02 | | 04 | 01 | - | 02 | 01 | 27 | - | 27 |
| **යටිතල උපයෝගිතා** | 01 | 03 | 06 | 04 | 01 | | 01 | 03 | 02 | | 02 | 23 | 05 | 28 |
| **ඡන්ද ලියාපදිංචිය පිළිබද පැමිණිලි** | - | - | - | - | | - | - | | - | - | - | - | 01 | 01 |
| **රාජ්‍ය ආයතනවල නොසළකා හැරීම් පිළිබද පැමිණිලි** | 04 | 15 | 15 | 27 | 20 | 06 | 24 | 35 | 20 | 18 | 12 | 196 | 72 | 268 |
| පොලිසිය | 01 | 11 | 08 | 17 | 14 | 03 | 19 | 12 | 19 | 8 | 11 | 123 | 37 | 160 |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනෙකුත් රාජ්‍ය අධිකාරී | 03 | 04 | 07 | 10 | 06 | 03 | 05 | 23 | 01 | 10 | 01 | 73 | 35 | 108 |
| ළමා අයිතිවාසිකම් | - | - | - | - | 01 | - | 02 | | - | 01 | 01 | 05 | - | 05 |
| ආබාධිත සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් | - | - | - | - | - | - | - | | - | - | - | - | - | |
| භාෂා අයිතිවාසිකම් | - | - | - | - | 01 | - | - | | - | - | - | 01 | 02 | 03 |
| සංක්‍රමණ ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් | - | - | - | - | 01 | - | - | | - | 02 | 05 | 08 | 04 | 12 |
| **LGBTIQ** අයිතිවාසිකම් | - | - | - | - | 01 | - | - | | - | - | - | 01 | - | 01 |
| සෞඛ්‍යය | - | - | - | - | 01 | - | - | | 04 | - | - | 05 | - | 05 |
| ඉඩම් හා දේපළ අයිතිවාසිකම් | 13 | 28 | 02 | 06 | 01 | 04 | 04 | 04 | 15 | 02 | 14 | 93 | 16 | 109 |
| අභ්‍යන්තරව අස්ථානගතවූවන්/පෙරළා පැමිණෙන සරණාගතයින් | - | - | - | - | - | - | - | | - | - | 02 | 02 | - | 02 |
| පරිසරික | - | - | - | 06 | 02 | - | 02 | - | - | - | - | 10 | 06 | 16 |
| පරිපාලන කටයුතු | 01 | 04 | 09 | 06 | 08 | 06 | 02 | 16 | 11 | 04 | 04 | 71 | 76 | 147 |
| කාන්තා අයිතිවාසිකම් | - | - | - | - | - | | - | | - | - | - | - | - | - |
| වැඩිහිටි අයිතිවාසිකම් | - | - | - | - | - | - | - | | - | - | - | - | - | - |
| වෙනත් කණ්ඩායම් | - | - | - | - | 03 | - | - | | 03 | - | 04 | 10 | - | 10 |
| භාර නොගත්/කටයුතු නොකළ හැකි | 08 | 40 | 05 | - | - | - | - | 36 | - | 05 | - | 94 | 188 | 282 |
| වැඩිදුර තොරතුරු අපේක්ෂිත පැමිණිලි | - | - | - | - | - | - | - | | - | - | - | - | 115 | 115 |
| එකතුව | **44** | **164** | **63** | **83** | **77** | **25** | **68** | **155** | **100** | **44** | **96** | **919** | **915** | **1834** |

## රැඳවුම්ස්ථාන පරික්ෂාව ( 2017.04.01 සිට 2017.06.30 දක්වා)

| ප්‍රධාන කාර්යාලය | පොලිස් ස්ථාන | බන්ධනාගාර | ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID) |
|---|---|---|---|
| | 242 | 05 | 02 |

| *ප්‍රාදේශීය කාර්යාල* | අම්පාර | අනුරාධපුරය | බදුල්ල | මඩකලපුව | යාපනය | කල්මුණේ | මහනුවර | මාතර | ත්‍රිකුණාමලය | වවුනියාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ස්ථානය** | | | | | | | | | | |
| පොලිස් ස්ථාන | 36 | 90 | 29 | 24 | 47 | 24 | 125 | 99 | 22 | 32 |
| බන්ධනාගාර | - | 04 | - | 07 | 04 | - | 02 | 03 | 03 | - |
| ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය නිල සංචාර | - | - | - | - | - | - | - | - | - | 2 |
| ළමා නිවාස | 1 | 11 | - | 4 | - | 2 | - | 1 | - | |
| පුනරුත්ථාාපන මධ්‍යස්ථාන/ ආබාධිත පුද්ගල නිවාස | - | 2 | - | - | - | - | - | - | - | 2 |
| වැඩිහිටි නිවාස | 2 | 2 | 1 | - | - | - | 2 | - | - | - |

## පැවැත්වූ හා සහභාගී වූ රැස්වීම්/සාකච්ඡා හා වැඩසටහන්

| | |
|---|---|
| 2017.04.04 | ආසියා පදනම විසින් සංවිධානය කරණ ලද, "Reflection"යනුවෙන් නම් කරන ලද මානසික සෞඛ්‍යය හා මනෝවිද්‍යාත්මක සහාය වැඩ සටහනට සහභාගී විය. |
| 2017.04.04 | එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේමානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදය හා ශ්‍රමය පිළිබඳ කාර්යාංශයේ කණ්ඩායමක් සමග රැස්වීම |
| 2017.04.05 | නීතිය හා සමාජ භාරකාරය සහ ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය විසින් සංවිධානය කරන ලද, ආර්ථික,සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් ව්‍යවස්ථානුගත කිරීම පිළිබඳ සාකච්ඡාවට සහභාගීවීම |
| 2017.04.18 | සරණාගතයින් පිළිබඳ උපදේශකයින් සමග රැස්වීම |
| 2017.05.12 | බුද්ධශාසන අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද එක්සත් ජාතීන්ගේ වෙසක් සැමරුම් උත්සවයට සහභාගීවීම. |
| 2017.05.16 | යුදහමුදා පිරිස් එක්සත් ජාතීන්ගේ සාම හමුදා ලෙස සේවයේ යෙදවීම ගැන ශ්‍රී ලංකා යුද හමුදා සන්ධාන නිලධාරීන් සමග රැස්වීම. |

| | |
|---|---|
| 2017.05.16 | ස්වාධීන කොමිෂන් සභා සභාපතීන් සමග රැස්වීම |
| 2017.05.16 | ලෝක මාධ්‍ය නිදහස දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රියාකාරී මාධ්‍ය වේදින්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයට සහභාගී වීම |
| 2017.05.17 | අතිගරු ජනාධිපතිතුමා සමගරැස්වීම |
| 2017.05.25 | විගණකාධිපති සමග පැවැත්වූ ස්වාධීන කොමිෂන් සභා ලේකම්වරුන්ගේ රැස්වීමට සහභාගීවීම |
| 2017.05.29 | ජනාධිපති ලේකම් සමග රැස්වීම |
| 2017.06.02 | භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් සමග රැස්වීම |
| 2017.05.30 | ගරු කථානායක/ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති සමග රැස්වීම |
| 2017.05.31 | එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්ගේ කාර්යාලයේ නියෝජිතයින් හා සමග රැස්වීම |
| 2017.06.02 | ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද, ළමා හිංසනය අවසන් කිරීමේ ජාතික සහයෝගිතාවය පිළිබඳ වැඩ සටහනකට සහභාගීවීම |
| 2017.06.05 | ඒසියා- ඕෂනියා යුරෝපීය සංගම් කමිටුව සමග රැස්වීම |
| 2017.06.09 | එච්.අයි.වී./ඒඩ්ස් ආසාධිත දරුවා පිළිබඳගණේමුල්ල, කුඩා බොලත්ත ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පති විසින් සංවිධානය කරන ලද දෙමාපිය රැස්වීමට සහභාගී වීම |
| 2017.06.13 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සමග රැස්වීම |
| 2017.06.13 | නීතිය හා සාමය අමාත්‍යාංශයේ ලේකම් සහ අනෙකුත් රාජ්‍ය නිලධාරීන් සමග රැස්වීම |
| 2017.06.21 | ජීවිත හිමිකම් මානව අයිතිවාසිකම් මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි හිංසනය පිළිබඳ වාර්තාමය වැඩ සටහනක සම්මුඛසාකච්ඡාවකට සහභාගීවීම |
| 2017.06.27 | Right to Life මානව අයිතිවාසිකම් මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද, හිංසනයෙන් නිදහස් ලත් අයට සහාය දැක්වීමේ ජාත්‍යන්තර දින සැමරුම් උත්සවයකට සහභාගී වීම |
| 2017.06.28 | ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලීය මහලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සම්මන්ත්‍රණයට සහභාගී වීම |
| 2017.06.28 | රයිට්ස් නව් ඇන්ඩ් ෆෝකුස් විමෙන් ආයතනය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ කාන්තාව හා ස්වාධීන කොමිෂන් සභා පිළිබඳ වැඩ සටහනට සහභාගී වීම |
| 2017.06.30 | ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන පිළිබඳ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය විසින් සංවිධානය කරන ලද, දකුණු අප්‍රිකානු අත්දැකීම් හා ජාත්‍යන්තර සන්දර්භය : ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ වටමේස සාකච්ඡාවට සහභාගීවීම |
| 2017.06.30 | දකුණු ආසියාවේ මානව හිමිකම් ගැටළු, නව ගෝලීය ක්‍රියාපරිපාටිය මත පිහිටා එක්සත් ජාතීන්ගේ භූමිකාව ප්‍රතිවිග්‍රහයකට භාජනය කිරීම ගැන පර්යේෂණ පත්‍රිකාවක් සකස් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ගුවන් හමුදාපති හා සමග සම්මුඛ සාකච්ඡාවකට සහභාගී වීම. |

**<u>ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සහ සිවිල් සංවිධාන රැස්වීම්</u>**

**<u>( 2017.04.01සිට 2017.06.30 දක්වා)</u>**

| | |
|---|---|
| අම්පාර | - |
| අනුරාධපුරය | 2 |
| බදුල්ල | - |
| මඩකලපුව | 4 |
| යාපනය | 1 |
| මහනුවර | 2 |
| කල්මුණේ | 4 |
| මාතර | 2 |
| ත්‍රිකුණාමළය | 2 |
| වවුනියාව | - |

**<u>රැස්වීම් ( අභ්‍යන්තර)</u>**

| **රැස්වීම්** | **අප්‍රියෙල්** | **මැයි** | **ජූනි** |
|---|---|---|---|
| මණ්ඩල රැස්වීම් | - | 2 වන දින හා 15 වන දින | 20 වන දින |
| කොමසාරිස්වරුන්ගේ රැස්වීම් | 17 වන දින | 8 වන දින | 12 වන දින |
| ජ්‍යෙෂ්ඨ කළමණාකාර රැස්වීම් | 5 වන දින | 17 වන දින | 13 වන දින |
| ප්‍රාදේශීය සම්බන්ධීකාරක රැස්වීම් | - | - | 27 වන දින |
| කාර්ය මණ්ඩල රැස්වීම් | 6 වන දින | - | - |

**<u>සම්පත් දායකයින් ලෙස ක්‍රියා කිරීම</u>**

| **දිනය** | **මාතෘකාව** | **සංවිධායකයෝ** | **ඉලක්කගත කණ්ඩායම** |
|---|---|---|---|
| 2017.04.09 | කාන්තා අයිතිවාසිකම් | කොළඹ 13, විවේකානන්ද විද්‍යාලයේ, ආදි ශිෂ්‍ය සංගමය | ආදි ශිෂ්‍යයින් |
| 2017.05.24 | මානව අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයන් | බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික අභ්‍යාස ආයතනය | ආරක්ෂක සේවා අණ සහ කාර්ය මණ්ඩල විද්‍යාලයෙන් සහභාගීවන්නන් |

| | | | |
|---|---|---|---|
| 2017.05.30 | ශ්‍රී ලාංකීය කාන්තාවන්ට අදාළ නීති හා රෙගුලාසි | ආබාධිතත්ව සංවිධාන ඒකාබද්ධ පෙරමුණ | සාමාජික සංවිධානවල කාන්තාවන් |
| 2017.06.01 | මානව හිමිකම් සංකල්ප | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | බන්ධනාගාර නිලධාරීන් |

**<u>විදේශීය පුහුණු වැඩ සටහන් /සම්මන්ත්‍රණ</u>**

| වැඩ සටහන | සහාභාගිත්වය |
|---|---|
| ආසියා සංසදය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන විසින් 2017 අප්‍රියෙල් මස 24 සිට 26 දක්වා, තායිලන්තයේ බැංකොක් නුවර සංවිධානය කරන ලද යෝග්‍යකර්තා මූලධර්ම පිළිබඳ සම්මන්ත්‍රණය | මේනකා හේරත් මිය, වැඩ බලන අධ්‍යක්ෂ, (අධ්‍යාපන හා විශේෂ වැඩ සටහන්) සහ එස්.ඒ. විජයානන්ද මහතා, විමර්ශන නිලධාරී, ප්‍රාදේශීය කාර්යාලය, අනුරාධපුරය |
| 2017 ජූනි මස 5 – 7 දක්වා, තායිලන්තයේ බැංකොක් නුවර සංවිධානය කරන ලද ව්‍යාපාර සහ මානව හිමිකම් පිළිබඳ කලාපීය අධ්‍යයන පාඨමාලාව | චමිල් සත්‍යදාස මහතා, අධ්‍යාපන හා දත්ත නිලධාරී, ප්‍රාදේශීය කාර්යාලය, අනුරාධපුරය |

**<u>අධීක්ෂණ ක්‍රියාකාරකම්</u>**

| දිනය | ක්‍රියාකාරකම |
|---|---|
| 2017.05.05 | මිරිහාන ජාතික රැඳවුම් මධ්‍යස්ථානයේ නිල චාරිකාව |

**<u>ස්වයං මැදිහත්වීම් (SuoMotu) 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 14 වන වගන්තිය යටතේ)</u>**

වයඹ පළාතේ, පන්නල, සඳලංකාවේ, ජල ප්‍රශ්ණයක් සම්බනධයෙන්, 2017.06.05 වන දින කොමිෂන් සභාව මැදිහත් විය.

**<u>තේමාත්මක අනු කමිටු රැස්වීම්</u>**

| දිනය | අනු කමිටුව |
|---|---|
| 2017.05.17 | LGBTIQ අනු කමිටු රැස්වීම |
| 2017.05.31 | අධ්‍යාපන ප්‍රතිපත්ති අනු කමිටු රැස්වීම |
| 2017.06.23 | සංක්‍රමණ ශ්‍රමික අනු කාරක සභා රැස්වීම |
| 2017.06.22 | සමාජභාවී අනු කමිටු රැස්වීම |

මාධ්‍ය වැඩ සටහන්

| **දිනය** | **රූපවාහිණී/ගුවන් විදුලි වැඩ සටහන් සහ පුවත්පත් ලිපි** | **නාලිකාව/පුවත්පත** | **කොමිෂන් සභා සහභාගිත්වය** |
|---|---|---|---|
| 2017.06.07 | ආයුබෝවන් සුබ දවසක් | ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාව | ආචාර්ය දීපිකා උඩගම, සභාපතිනී |
| 2017.06.26 | ෆේස් ද නේෂන් | ඇම්ටීවී | සභාපතිනී ,ආචාර්ය දීපිකා උඩගම සහ කොමසාරිස්, අම්බිකා සත්කුණනාදන් |
| 2017.06.30 | Open Forum | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | ආචාර්ය දීපිකා උඩගම, සභාපතිනී |

ප්‍රාදේශීය කාර්යාල විසින්, 2017.04.01 සිට 2017.06.30 දක්වා කාලය තුළ පවත්වන ලද මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව සහ සපයන ලද දේශන සහාය

| **ප්‍රාදේශීය කාර්යාලය** | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| අම්පාර | - |
| අනුරාධපුරය | 6 |
| බදුල්ල | 1 |
| මඩකලපුව | 5 |
| යාපනය | 4 |
| මහනුවර | 3 |
| කල්මුණේ | - |
| මාතර | - |
| ත්‍රිකුණාමළය | - |
| වවුනියාව | - |

<u>මූල්‍ය වාර්තාව ( 2017.04.01 සිට 2017.06.30 දක්වා)</u>

| | |
|---|---|
| **ආරම්භක ශේෂය** | 3,524,461.99 |
| **මහා භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම** | |
| පුනරාවර්තන | 67,060,000.00 |
| ප්‍රාග්ධන | - |
| වෙනත් ආදායම් | 33,683.67 |
| **එකතුව** | **70,618,145.66** |
| | |
| **වියදම්** | |
| පෞද්ගලික පඩිනඩි | 24,700,689.03 |
| ගමන් වියදම් | 162,044.00 |
| සැපයුම් | 1,067,983.40 |
| නඩත්තු වියදම් | 333,190.78 |
| සේවා | 40,703,102.12 |
| මාරු කිරීම් | 914,172.49 |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | - |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 10,500.00 |
| ධාරිතා ගොඩනැගීම | 39,686.00 |
| | |
| **සමස්ත වියදම** | **67,931,367.82** |